බ:කො:ජ: චක්‍රලේඛ අංක:- 14 /2016.

මගේ අංක: බු:අ: /2016,

බන්ධනාගාර මූලස්ථානය,

2016.03.05 වෙනි දින.

බන්ධනාගාර අධිකාරි,

වැලිකඩ/ බෝගම්බර/ මහර/ කො.රි.බ. හා මැගසින්

<u>බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නිලධාරින් රාජකාරි යෙදවීම.</u>

බ:කො:ජ: චක්‍රලේඛ අංක: 06/2016 හා 2016.01.28 දිනැතිව මා විසින් දක්වා ඇති පරිදි බන්ධනාගාරවල නිතිවිරෝධි ද්‍රව්‍ය මැඩලීමේ අරමුණු ඇතිව නියමු ව්‍යාපෘතියක් වශයෙන් බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකයේ ජේලර්,සැරයන් හා නියාමක නිලධාරින්ගෙන් සමන්විත කණ්ඩායම් අදාල ආයතනවලට යොමුකර එම ආයතනයේ අධිකාරිවරයාගේ අධික්ෂණයට හා මෙහෙයවීම යටතට පත් කරන ලදි.

මෙම නියමු ව්‍යාපෘතිය මගින් බුද්ධි හා ආරක්ෂක ඒකකයේ සේවය වඩාත් විධිමත්ව හා ඵලදායිව අදාල ආයතනයන්ට ලබාදීම අපේක්ෂිත අරමුණ වුවද, එම ඉලක්ක සපුරා ගැනීමේදී මතුව ඇති ගැටළු හේතුවෙන් හා බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නව වැඩපිළිවල සලකා බැලීමේදී මින් ඉදිරියට පහතින් සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙසට අදාල ආයතනයන්හි අධිකාරීවරුන්ට දන්වන අතර මා විසින් නිකුත් කරන ලද 2016.01.28 දිනැති අංක 06/2016 දරණ චක්‍රලේඛණය මින් සංශෝධනය කරන බවට දන්වමි.

1. මින් ඉදිරියට බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නිලධාරින් අදාල ආයතනයන්හි රාජකාරි යෙදවීම්දී, මහර හා දුම්බර යන බන්ධනාගාරයන් සඳහා දින 15ක කාලයකට එම යෙදවීම් සිදු කරනු ලබන අතර අනෙකුත් ආයතනයන්හි රාජකාරි සඳහා දෛනිකව නිලධාරින් යෙදවීමට බුද්ධි අංශය මගින් කටයුතු කල යුතුවේ. තවද නිවාඩු ලබාදීම් ඇතුලු සියළු කටයුතු වල වගකීම් බුද්ධි හා ආරක්ෂක ඒකකයේ සහකාර අධිකාරිවරයා හා ප්‍රධාන ජේලර්වරයාගේ යටතට පත් කරමි.

2. මෙසේ සේවයේ යොදවනු ලබන බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නිලධාරින් අදාලා රාජකාරි වේලාව තුල මෙහෙයවා බන්ධනාගාරය තුලට තහනම් ද්‍රව්‍ය ඇතුල්වීම වැලැක්වීමට පියවර ගැනීම අදාල ආයතනයේ අධිකාරිවරයාගේ වගකීම වේ. බුද්ධි හා ආරක්ෂක අංශ නිලධාරින්ට මේ වන විට බන්ධනාගාර වලට තහනම් ද්‍රව්‍ය ඇතුල්වීම වලක්වා ගැනීමේ උපක්‍රම පිළිබඳව

ප්‍රමාණවත් පුහුණුවක් ලබාදී ඇති බැවින් එම නිලධාරින්ගේ උපරිම සේවය ලබා ගැනීම අදාල ආයතනයේ අධිකාරිවරයාගේ වගකීම වේ. බැවින් නිසි ක්‍රමවේදයන් බුද්ධි හා ආරක්ෂක අංශ නිළධාරින් සමග සාකච්ඡා කර සකස් කර බන්ධනාගාර තුළ තහනම් ද්‍රව්‍ය මැඩලීමට අධිකාරිවරු සියළු පියවර ගතයුතුය.

3. අදාල ආයතනයන්හි බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නිලධාරින් යොදවනු ලබන රාජකාරින්ට අමතරව වෙනත් රාජකාරියක් සඳහා බුද්ධි ඒකකයේ නිලධාරින්ගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳව බුද්ධි හා ආරක්ෂක ඒකකයේ සහකාර අධිකාරිවරයා සමඟ සාකච්ඡාකොට ඒ සඳහා නිලධාරින් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය

පිටපත්: බන්ධනාගාර කොමසාරිස් (බුද්ධි හා ආරක්ෂක)
සහකාර අධිකාරි - බුද්ධි හා ආරක්ෂක ( දැනගැනීම සඳහා)